# පාලින්ද නුවර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | තනතුරෙහි ස්වභාවය |
|---|---|---|---|---|---|
| 1. | කාර්යාල කාර්ය සහායක III | 01 | PL1 2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.) | ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත |

02. *කායික සුදුසුකම් :*

තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03.
i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය
ii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
iii. යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
v. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

04. *වයස :* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වැඩිම ලකුණු ලබාගත් අනු පිළිවෙල මත බඳවා ගැනීම සිදු කෙරේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම:*

i. අයදුම්කරුවන් මේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියලෙ කර ගන්නා ලද අයදුම්පත 2018.07.11 හෝ එදිනට පෙර ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්ද නුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ii. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ , කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය.

iii. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. පාසලෙන් අස්වීමේ සහතිකය,
04. පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය, (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුයි)
05. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ලේකම්,
පාලින්ද නුවර ප්‍රාදේශීය සභාව.

2018 ජුනි මස 08 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

*පාලින්දනුවර ප්‍රාදේශීය සභාව*

*පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ කාර්යාල කාර්ය සහායක III තනතුරු සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.
03. ස්ථිර ලිපිනය :————————
04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————————————.
05. දිස්ත්‍රික්කය :————————————.
06. උපන් දිනය : අවුරුදු :———— මාස :———— දින :————
07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2018.07.11) අවු. :———— මාසः———— දිනः————
08. ස්ත්‍රී/පුරුෂ භාවය :————————
09. විවාහක/අවිවාහක යන වග:————————
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග:————————
11. ජාතික හැඳුනුම්පත් අංකය :————————
12. දුරකථන අංකය :————————
13. අධ්‍යාපන සුදුසුකම් :————————

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි.

මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

.....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : .....................................

06-1067